**රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක:32/89 (iii)**

රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරශ්‍රය.
කොළඹ 7.
1990 ජුලි මස 19 දින.

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා සභාපතිවරුන් වෙත,

**1980 ජුලි මස තනතුරු හැරගිය රාජ්‍ය නිලධාරීන්ට සහ සේවකයන්ට සහන සැලසීම.**

1989.06.09 දිනැති අංක:32/89 (1) සහ 1989.09.29 දිනැති අංක:32/89 (ii) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ කෙරෙහි ඔබේ අවධානය යොමු කරවමි.

02. මුදල් නොමැතිකම හේතුකොට ගෙන 1980 ජුලි මස සේවය හැරගිය තැනැත්තන්ට සහන සැලැස්වීමට නොහැකි දෙපාර්තමේන්තු සහ සංස්ථා විසින් මෙම කාර්යය සඳහා අවශ්‍ය අරමුදල් භාණ්ඩාගාරයෙන් ලබාගත යුතුයැයි රජය තීරණය කර ඇත. 1990 ජුලි මස 31 දිනට පෙර මේ සඳහා 1990 දී අවශ්‍ය මුදල පිළිබඳ විස්තර (නම තනතුර සහ ගෙවිය යුතු මුදල) මට ද පිටපතක් සහිතව භාණ්ඩාගාරය වෙත දන්වන මෙන් ඔබෙන් ඉල්ලා සිටිනු ලැබේ.

03. 1989 ජුනි 09 දිනංති අංක:32/89 (1) දරණ චක්‍රලේඛයේ 05 වැනි වගන්තිය යටතේ නංවත සේවයේ යොදවනු ලැබූ තැනැත්තන් සම්බන්ධව 1990 ජනවාරි 16 දිනැති අංක:4/90 සහ 1990 ජුනි 22 දිනංති අංක:4/90 (1) දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයන් අදාළ වේ. එබැවින් ඔවුන්ගේ විශ්‍රාම වැටුප් 1989 මැයි 08 දින සිට බල පැවැත්වෙන සේ ගෙවිය යුතුය.

04. 1990 අගෝස්තු 31 දිනට පෙර බලධාරීන් විසින් ලැබී ඇති සහන අයදුම්පත් හෝ සේවයේ යොදවා ඇති නිලධාරීන්ගෙන් ලැබී ඇති ඉල්ලීම් හෝ පිළිබඳ වැඩ අවසන් කළයුතුය. 1990 ජුලි 31 සහ අගෝස්තු 31 දිනට පෙර ලබාගෙන ඇති ප්‍රගතිය පිළිබඳව ප්‍රගති වාර්තාවක් මා වෙත එවිය යුතුය. උපදෙස් පිළි නොපදින සහ ප්‍රගතිය සතුටුදායක නොවන අවස්ථාවන් ගැන ජනාධිපති උතුමාණන් වෙත මෙම විෂයය ගංන ම විසින් යවනු ලබන මාසික ප්‍රගති වාර්තාවෙහි වාර්තා කිරීමට සිදුවනු ඇති බව දැන්වීමට කැමැත්තෙමි.

අ.කලේ/(ආචාර්ය පී.ඒ.ටී. ගුණසිංහ)
ලේකම්,
රාජ්‍ය පරිපාලන, පළාත් සභා හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය.